IHRA
UNIVERSITY OF COLOMBO

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**
**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2013**
**(දෙවන සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2015 මාර්තු)**

## BLE 308 - ශ්‍රමයේ නූතන ප්‍රවණතා

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින්(08) සහ පිටු තුනකින්(03) සමන්විතවේ.

(4) උත්තර පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) විභාගය අවසානයේදී සියලුම උත්තර පත්‍ර එකට ගැට ගැසිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. " වර්තමාන ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපළ " ඓතිහාසිකව වර්ධනය වෙමින් පැවත එනු ලැබුවකි. තවද වර්තමාන ශ්‍රම වෙළඳපළ තොරතුරු අධ්‍යනය කිරීමේදී වර්තමාන ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපළ හැසිරීම පිළිබිඹු වේ. එහෙත් වර්තමාන ශ්‍රම වෙළඳපළ ආශ්‍රිතව ජයගත යුතු අභියෝග රැසක් තවමත් ශේෂව පවතී. එසේ හෙයින්, එකී අභියෝග ජයගැනීමට පුළුල් කතිකාවතක් නිර්මාණය විය යුතුව ඇත.

ඉහත ප්‍රකාශය විස්තරාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 20)

02. ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් පිළිබඳ VI වන පරිච්ඡේදයේ 27 (6) උප ව්‍යවස්ථාවට අනුව, කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ රැකියාව හේතුවෙන් යම් අශක්නුතාවයකට පත් නොවන පරිදි පුරවැසියන්ට දියුණුවීමට සම ප්‍රස්තාවන් සැලසීමට රජය වගබලා ගත යුතුය.
එසේහෙයින්, ශ්‍රී ලංකාවේ රැකියා පරිසරය තුළ ශ්‍රමය සපයන කාන්තා ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කොට, තහවුරු කොට, ක්‍රියාවට නැංවීම පිණිස ශ්‍රී ලංකා රජය විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. එහෙත් ශ්‍රී ලාංකේය කාන්තාව රැකියා පරිසරය තුළ සැමවිටම සුරක්ෂිත නැත යන්න තවමත් නොවිසඳුණු ගැටලුවකි.

උක්ත ප්‍රකාශය පිළිබඳව විමර්ශනාත්මකව අදහස් දක්වන්න.

(ලකුණු 20)

03. පහත සඳහන් මාතෘකා අතරින් ඔබ තෝරාගත් ඕනෑම මාතෘකා හතර(04) ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(I) 1989 ළමා අයිතිවාසිකම් සම්මුතිය විශේෂයෙන් 01 වන හා 32 වන ව්‍යවස්ථා

(II) 1993 කාන්තා ප්‍රඥප්තිය

(III) 1985 අංක 21 දරණ විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත

(IV) 1948 මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 01 වන සහ 23 වන වගන්ති

(V) ගෝලීයකරණ ක්‍රියාවලිය ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපළ විෂයෙහි කරන ලද බලපෑම

(5 x 4 ලකුණු 20)

04. රැකියා පරිසරය තුළ සේව්‍ය - සේවක දෙපාර්ශවය අතර ගැටුම් අවම කිරීම, ඔවුන් අතර තිරසාර ලෙස සමගිය පවත්වාගෙන යාම, තෘප්තිමත් සේව්‍ය - සේවක දෙපිරිසක් බිහිකිරීම යන අංශ ඔස්සේ ජාතික ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම සහ තරඟකාරී ලෝක ආර්ථිකය විෂයෙහි කම්කරු ශ්‍රමය බලගැන්වීම උදෙසා ජාතික කම්කරු ප්‍රතිපත්තියක් සකස් කිරීමේ කාලය දැන් උදාවී ඇත.

උක්ත ප්‍රකාශය පිළිබඳව අදහස් දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

05. වර්ෂ 2014 ජූනි මස 12 වන දිනට යෙදී තිබුණු, අන්තර්ජාතික කම්කරු සංවිධානය විසින් සමරන්නට යෙදුණු "ළමා ශ්‍රමයට එරෙහිව ජාත්‍යන්තර දිනය" හී මෙවර තේමාව වී තිබුණේ "ළමා ශ්‍රමයට එරෙහිව සැවොම එක්වෙමු " යන්නයි.

අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සාමාජික රාජ්‍යයක් ලෙසට ශ්‍රී ලංකා රජය ළමා ශ්‍රමයට එරෙහිව ක්‍රියාවට නංවා ඇති සහ ඉදිරියට ක්‍රියාත්මක කරමින් සිටින වැඩ පිළිවෙළ පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් සකස් කරන්න.

(ලකුණු 20)

06. " විදේශ රැකියා නියුක්තිය" ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය ප්‍රවර්ධනය කිරීමෙහිලා ඉටු කරනු ලබන මෙහෙවර අතිමහත්ය. තවද ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අයිතිවාසිකම්, ආරක්ෂාව සහ සුභසාධනය තහවුරු කිරීම උදෙසා ශ්‍රී ලංකා රජය මහත් පරිශ්‍රමයක් දරනු ලබයි. එහෙත් විදේශ රැකියා නියුක්තිය තුළදී ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයන්ද ඊට සමගාමීව ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ද මුහුණපානු ලබන ඛේදනීය තත්වයන් එනයින්ම බැහැර කළ නොහැක. එසේ හෙයින්, ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් නැවත බලගන්වා ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කොට තහවුරු කිරීමේ අවශ්‍යතාවය යළි පැන නැගී ඇත.

උක්ත ප්‍රකාශය පිළිබඳව කරුණු දක්වමින් තහවුරු කරන්න.

(ලකුණු 20)

07. " ගෝලීයකරණය" ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපළ සහ නිෂ්පාදන ක්‍රියාවලිය විෂයෙහි කරන ලද බලපෑම නොතකා හැරිය නොහැක.

ඉහත ප්‍රකාශය විමර්ශනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

08. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන කම්කරු නීති ප්‍රතිපාදන, ජාත්‍යන්තර සම්මුතීන්හි ආරක්ෂාව සහ ආයෝජන මණ්ඩල කම්කරු ප්‍රමිතීන් නිදහස් වෙළඳකලාප ආශ්‍රිතව සේවය සපයන ශ්‍රමික ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කොට තහවුරු කිරීම උදෙසාත්, තෘප්තිමත් රැකියා පරිසරයක් ස්ථාපිත කිරීම උදෙසාත් යථාපරිදි ක්‍රියාවට නැංවේ.

උක්ත ප්‍රකාශය පිළිබඳව අදහස් දක්වමින් විග්‍රහ කරන්න.

(ලකුණු 20)